**බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් - 2024 දෙසැම්බර් 09 සිට 20 දක්වා**

---

2024 දෙසැම්බර් 9 සිට 20 දක්වා කාලය තුළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ලංකා බැංකුවට පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිතයක් වන බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් (BOC UK) හි කටයුතු පිළිබඳව විගණන පරීක්ෂාවක් මාගේ ඍජු අධීක්ෂණය යටතේ සිදුකරන ලදි. පාර්ලිමේන්තුවේ අවධානයට යොමුකළ යුතු යැයි මා සලකන කරුණු මෙම වාර්තාවේ දැක්වේ.

## 1.1 බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් පිළිබඳව හැඳින්වීම

### 1.1.1 සංස්ථාපනය කිරීම

බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් යනු 2010 වසරේදී එක්සත් රාජධානියේ නීතිය යටතේ ලියාපදිංචි බැංකු ආයතනයක් වන අතර සහ ශ්‍රී ලංකාවේ ලංකා බැංකුවට සියයට සියයක හිමිකාරිත්වය දරන පරිපාලිතයක් වේ. මෙම බැංකුව, 1949 සිට 2010 දක්වා ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක විය. එක්සත් රාජධානියේ නියාමක ආයතනවල පීඩනය හේතුවෙන්, එය ලංකා බැංකුවේ පරිපාලිතයක් ලෙස සංස්ථාපනය කරන ලද අතර, එම නිසා එක්සත් රාජධානියේ නියාමක ආයතන වන ප්‍රුඩෙන්සියල් රෙගුලේසියන් ඔතෝරිටි (Prudential Regulation Authority -PRA) සහ ෆයිනෑන්සියල් කන්ඩක්ට් ඔතෝරිටි (Financial Conduct Authority - FCA) හි අධීක්ෂණය යටතට පැමිණි අතර, පාලනය සහ දේශීය මෙහෙයුම් ව්‍යුහයන් නිර්මාණය කිරීම අවශ්‍ය විය. එක්සත් රාජධානියේ සහ යුරෝපයේ ශ්‍රී ලංකාවේ මූල්‍ය නියෝජිතයා ලෙස බැංකුව උපාය මාර්ගික වැදගත්කමක් දරනු ලැබේ.

### 1.1.2 ව්‍යාපාර පරිසරය

වර්තමානයේ එක්සත් රාජධානියේ බැංකු කර්මාන්තය ඉතා තරඟකාරීවන අතර Lloyds Group, Barclays, the Royal Bank of Scotland, HSBC Holdings, NatWest, Standard Chartered, Santander UK7, Nationwide Building Society, Virgin Money UK සහ Metro Bank ඇතුළු ඉතා විශාල බැංකු කිහිපයක් විසින් ආධිපත්‍ය දරනු ලැබේ. සියලු වර්ගයේ ව්‍යාපාර සඳහා වෙළඳපොළ කොටස් අනුව, වෙළඳපොළ පැහැදිලිවම කතිපයාධිකාරී වේ.

පරිපාලිත සමාගමක් බවට පරිවර්තනය වීමෙන් පසු මුල් අවධියේදී, ව්‍යාපාරය පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා PRA අවශ්‍යතා සපුරාලීමට කාලය සහ උත්සාහ දැරීම අවශ්‍ය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඛණ්ඩ පාඩු සිදුවිය. කිසිදු පෙර වාර්තා නොමැති නව බැංකුවක් ලෙස, ණය දීම සඳහා ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් මව් බැංකුවේ අරමුදල් මත විශ්වාසය තැබීමට සිදු විය.

බැංකුව, භාණ්ඩාගාර මෙහෙයුම්, එංගලන්ත බැංකුව සමඟ එක්දින මුදල් (GBP) තැන්පත් කිරීම, එංගලන්තයේ BTL (Buy to let) ගනුදෙනුකරුවන්ට ණය දීම සහ ශ්‍රී ලංකාවේ බැංකු සමඟ බැංකු කටයුතු කිරීම, ව්‍යාපාර ණය, අයිරා, බිල්පත් වට්ටම් කිරීම සහ ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව බැඳුම්කර, එක්සත් ජනපද භාණ්ඩාගාර බිල්පත් සහ යුරෝපීය සාංගමික බැඳුම්කරවල ආයෝජනය කිරීම සිදු කරනු ලබයි. තැන්පතු සහ ණය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් විශේෂිත වූ කුඩා බැංකුකරණයක් බැංකුව සතුව ඇත.

### 1.1.2 බැංකුවේ පාලන ව්‍යුහය

බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් යනු එංගලන්තයේ සංස්ථාගත කරන ලද සමාගමක් වන අතර එය වාණිජ බැංකුවක් ලෙස ක්‍රියාත්මක වේ. එයට PRA විසින් බලය පවරනු ලැබ ඇති අතර PRA සහ FCA විසින් නියාමනය කරනු ලැබේ. බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් පහත සඳහන් පරිදි අධ්‍යක්ෂවරුන් හය දෙනෙකුගෙන් (6) සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලැබේ.

i) විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක්

ii) බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (COO)

iii) ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක්

2020 පෙබරවාරි 5 වන දින පැවති බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල (මණ්ඩලය) රැස්වීමේදී අනුමත කරන ලද අධ්‍යක්ෂවරුන්ගේ පත් කිරීම, ඇගයීම, වෘත්තීය සංවර්ධනය සහ ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුව, බැංකුවේ මණ්ඩලය පහත පරිදි ව්‍යුහගත කර ඇත.

| අධ්‍යක්ෂවරයාගේ ස්වභාවය | අධ්‍යක්ෂවරු වර්ගය | නම්කරනු ලබන්නේ |
|---|---|---|
| කොළඹ පිහිටි ලංකා බැංකුවේ සභාපති | විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂක | කොළඹ ලංකා බැංකුව විසින් නම් කරනු ලැබේ. නම් කරනු ලබන අය සාමාන්‍යයෙන් කොළඹ ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරුන් හෝ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින් වනු ඇත. |
| කොළඹ පිහිටි ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරී | විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂක | |
| බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි ප්‍රධාන විධායක නිලධාරී (CEO) | විධායක අධ්‍යක්ෂක | ප්‍රධාන විධායක නිලධාරියා පත් කරනු ලබන්නේ කොළඹ ලංකා බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තියට අනුව, වසර තුනක කාලයක් සඳහා වේ. |
| බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (COO) | විධායක අධ්‍යක්ෂක | ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා පත් කරනු ලබන්නේ කොළඹ ලංකා බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තියට අනුව, වසර තුනක කාලයක් සඳහා වේ. |
| වෙනත් අධ්‍යක්ෂවරු දෙදෙනෙකු | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු | කොළඹ ලංකා බැංකුවේ සහයෝගය ඇතිව පත් කරනු ලැබේ. |

සියලුම අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් සහ නැවත පත් කිරීම් සඳහා බැංකුවේ කොටස් හිමියාගේ සහාය, පත්වීමට එකඟ වන බවට කොළඹ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක පිටපතක් මඟින් අවශ්‍ය වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට අයදුම්කරු සම්බන්ධයෙන් අභියෝග කිරීමට හෝ පැහැදිලි කිරීමක් ලබා ගැනීමට හැකිය. සතුටුදායක ප්‍රතිචාරවලට යටත්ව, අපේක්ෂකයා බහුතර ඡන්දයෙන් පත් කරනු ලැබේ. සියලුම අධ්‍යක්ෂවරුන් පත් කිරීම් බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සාමාන්‍යයෙන් වසර තුනක කාලයක් සඳහා කොළඹ ලංකා බැංකුව වෙතින් ද්විතීයික පදනම මත පත් කරනු ලැබේ. ඔවුන් සාමාන්‍යයෙන් ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන අතර එක්සත් රාජධානියේ පිහිටි පරිපාලිතයේ අධ්‍යක්ෂවරුන් ලෙස සේවය කිරීම සඳහා නිසි ලෙස අනුමත කරන ලද තේරීම් ක්‍රියාවලියකින් පසුව කොළඹ ලංකා බැංකුව විසින් නම් කරනු ලැබේ. කොළඹ ලංකා බැංකුව විසින් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තෝරා ගනු ලබන අතර, බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තේරීම අනුමත කර එක්සත් රාජධානියේ නියාමක වන PRA ට අවශ්‍ය පරිදි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය (SMF) අනුමැතිය සඳහා අයදුම්පත නිර්දේශ කරයි.

ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු කොළඹ ලංකා බැංකුව විසින් නම් කරනු ලබන අතර ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු සාමාන්‍යයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධුරයට පත් කරනු ලැබේ. අතීත පිළිවෙතට අනුව, කොළඹ ලංකා බැංකුවේ සභාපති සහ සාමාන්‍යාධිකාරීවරයා ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ලෙස කොළඹ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කර තිබුණි. ඔවුන් බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් විසින් සේවයේ යොදවා නොමැති බැවින්, බැංකුවේ අධ්‍යක්ෂවරුන් ලෙස ඔවුන්ගේ භූමිකාවන් සඳහා ඔවුන්ට කිසිදු වේතනයක් නොලැබේ.

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සිටිය යුතු අතර, ඉන් එක් අයෙකු විගණන සහ අවදානම් කමිටුවේ සභාපතිවරයා වේ. අයදුම්කරුවන් දැනුවත් කොන්ත්‍රාත්තු හෝ ස්ථාපිත බඳවා ගැනීමේ ආයතන හරහා තෝරා ගනු ලබයි. අයදුම්කරු චරිතයෙන් සහ විනිශ්චයෙන් ස්වාධීනද යන්න සහ අධ්‍යක්ෂවරයාගේ විනිශ්චයට බලපෑම් කළ හැකි සබඳතා හෝ තත්වයන් තිබේද යන්න මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

**1.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.2.1 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ණය සහ අත්තිකාරම් සඳහා සීමිත ණය ලබාගන්නන් සංඛ්‍යාවක් මත යැපීම**<br><br>2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් ශේෂය ස්ටර්ලින් පවුම් 34,032,241 ක් වූ අතර එයින් ස්ටර්ලින් පවුම් 24,694,307 ක් හෙවත් සියයට 73 ක් බැංකුවේ ඉහළම ණය ගන්නන් 25 දෙනා අතර පැතිරී ඇත. එසේම, උකස් කිරීමට මිලදී ගන්නා (Buy to let Mortgage) සහ මිශ්‍ර වාණිජ ණය යන කාණ්ඩ යටතේ ලබා දී ඇති ණය, බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් කළඹෙන් සියයට 87 ක් නියෝජනය කරයි.<br><br>2024 සැප්තැම්බර් 30 වන විට බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් ශේෂය ස්ටර්ලින් පවුම් 53,301,965 ක් වූ අතර ඉන් ස්ටර්ලින් පවුම් 32,524,101 ක් හෙවත් සියයට 61 ක් බැංකුවේ ඉහළම ණය ගන්නන් 25 දෙනා අතර පැතිරී ඇත. එසේම, උකස් කිරීමට මිලදී ගන්නා (Buy to let Mortgage) සහ මිශ්‍ර වාණිජ ණය යන කාණ්ඩ යටතේ ලබා දී ඇති ණය, බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් කළඹෙන් සියයට 75 ක් නියෝජනය කරයි.<br><br>මෙයින් පෙන්නුම් කරන්නේ බැංකුව ඉහළ ණය වටිනාකමක් ඇති සීමිත ණය ගන්නන් සංඛ්‍යාවක් මත වැඩිරඳා පවතින බවත්, එමගින් ඉහළ සාන්ද්‍රණයකට සහ ඉහළ පැහැර හැරීමේ අවදානමකට නිරාවරණය විය හැකි බවත්ය. එසේම බැංකුවේ ණය කළඹෙන් වැඩි කොටසක් යම් කර්මාන්තයක ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති අතර එවැනි කර්මාන්තයක පහත වැටීම බැංකුවේ ණය පොතට අහිතකර ලෙස බලපෑ හැකිය. | බැන්ක් ඔෆ් සිලෝන් (යුකේ) ලිමිටඩ් ගනුදෙනුකරුවන්ට ණය දීමේදී ප්‍රධාන අවදානම් අවම කිරීමේ පියවර දෙකක් භාවිතා කරයි. පළමුව, ණය දීම Tier 1 ප්‍රාග්ධනයෙන් සියයට 25 කට සීමා කර ඇති අතර, PRA රෙගුලාසිවලට අනුකූලවීම සහතික කරයි. දෙවනුව, සියලුම ණය, දේපල හෝ තැන්පතුවක් මත සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කළ යුතුය. දේපල පදනම් ණය සඳහා, ණය වටිනාකම් (Laon to Value -LTV) අනුපාතය දේපල වටිනාකමෙන් උපරිම සියයට 70 කට සීමා වේ. මෙම විචක්ෂණශීලී ප්‍රවේශය පාරිභෝගික පැහැර හැරීමේ අවදානමට නිරාවරණයවීම අවම කරන අතර මූල්‍ය ස්ථාවරත්වය ශක්තිමත් කරයි. | සීමිත ණය ලබාගන්නන් සංඛ්‍යාවක් සහ විශේෂිත කර්මාන්ත මත යැපීම අවම කිරීම සඳහා, බැංකුව තම ණය කළඹේ සාන්ද්‍රණ අවදානම අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ විවිධ ණය ගැතියන්, අංශ සහ නිෂ්පාදන හරහා ණය දීම තවදුරටත් විවිධාංගීකරණය කිරීමට අවස්ථා සොයා බැලීමට නිර්දේශ කෙරේ. |

**1.2.2** තැන්පතු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **තැන්පතු සඳහා සීමිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් මත යැපීම**<br><br>2023 දෙසැම්බර් 31 වන විට බැංකුවේ මුළු තැන්පතු පදනම ස්ටර්ලින් පවුම් 19,228,900 ක් වූ අතර, ඉන් ස්ටර්ලින් පවුම් 16,296,046 ක් එනම් සියයට 85 ක් බැංකුවේ ඉහළම තැන්පත්කරුවන් 25 දෙනා අතර පැතිරී ඇත. එසේම, රේසින් වේදිකාව (Raising platform) හරහා එකතු කරන ලද තැන්පතු ප්‍රමාණය ස්ටර්ලින් පවුම් 13,873,103 ක් වූ අතර එය බැංකුවේ මුළු තැන්පතු පදනමෙන් සියයට 72 ක් නියෝජනය කරයි.<br><br>2024 සැප්තැම්බර් 30 වන විට බැංකුවේ මුළු තැන්පතු පදනම ස්ටර්ලින් පවුම් 37,613,000 ක් වූ අතර එයින් ස්ටර්ලින් පවුම් 34,766,771 ක් හෙවත් සියයට 92 ක් බැංකුවේ ඉහළම තැන්පත්කරුවන් 25 දෙනා අතර පැතිරී ඇත. එසේම රේසින් වේදිකාව හරහා එකතු කරන ලද තැන්පතු ප්‍රමාණය පවුම් 28,748,000 ක් වූ අතර එය බැංකුවේ මුළු තැන්පතු පදනමෙන් සියයට 76 ක් නියෝජනය කරයි.<br><br>මෙයින් පෙනී යන්නේ බැංකුව ඉහළ තැන්පතු වටිනාකමක් ඇති සීමිත ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් මත රඳා පවතින බවත්, එමඟින් ඉහළ ද්‍රවශීලතා අවදානමකට නිරාවරණය විය හැකි බවත්ය. එසේම, බැංකුව එහි අරමුදල්වල සාපේක්ෂ වශයෙන් විශාල කොටසක් තනි තැන්පත්කරුවෙකු වන රේසින් (Raising) හරහා එකතු කරමින් පවතියි. තැන්පතු එකතු කරන්නන්ගෙන් තරඟකාරිත්වය ශක්තිමත්ව පවතී. වෙළඳපල වෙනස්කම් සහ පාරිභෝගික හැසිරීම්වලට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය බැංකුව හඳුනාගත යුතු අතර, එහි වත්කම් කළඹේ වර්ධනයට සහාය වීම සඳහා අරමුදල් කඩිනමින් ආකර්ෂණය කර ගැනීමේදී තරඟකාරීව කටයුතු කරන බව සහතික කළ යුතුය. | අපගේ පොත්වල රේසින් හරහා වන තැන්පතුව දෛනික එකතු කිරීම් මත පදනම් වූ එකතුවක් ලෙස සටහන් වේ. කෙසේ වෙතත්, සෑම දෛනික එකතු කිරීමක්ම බහු තනි තැන්පතුවලින් සමන්විත වන අතර, ඒ සෑම එකක්ම FCA ඇපකරයට අනුකූලව, උපරිම ස්ටර්ලින් පවුම් 85,000 කට සීමා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සියලුම තැන්පතු ස්ටර්ලින් පවුම් 85,000 හෝ ඊට අඩු වන අතර, සාන්ද්‍රණ අවදානම ඵලදායී ලෙස අඩු කරයි. | විශේෂයෙන් රේසින් (Raising) වේදිකාව සහ ඉහළම තනි තැන්පත්කරුවන් මත රඳා පැවතීම සම්බන්ධයෙන් බැංකුව එහි තැන්පතු සාන්ද්‍රණ මට්ටම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට නිර්දේශ කෙරේ. බැංකුව, හදිසි මුදල් ආපසු ගැනීම් හෝ එකතු කිරීමේ ගිවිසුම්වල වෙනස්කම්වලට සම්බන්ධව වියහැකි අවදානම් තක්සේරු කළ යුතු අතර, තමන්ගේම මාර්ග හරහා පුළුල් පාරිභෝගික පදනමක් ආකර්ෂණය කර ගැනීමෙන් එහි තැන්පතු පදනම විවිධාංගීකරණය කිරීමට උපාය මාර්ග ක්‍රියාත්මක කළ යුතුය. |

**1.2.3 ගෙවිය යුතු දෑ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **පොදු ලෙජරයේ ගිණුම්වල පවතින දීර්ගකාලීනව නිරවුල් නොවූ ශේෂ**<br><br>2024 සැප්තැම්බර් 30 වන දිනට අවිනිශ්චිත ණයහිමියන්ගේ ගිණුමේ ස්ටර්ලින් පවුම් 8,144.62 ක ශේෂයක් වාර්තා වී ඇති අතර, ඉන් පවුම් 7,242.90 ක් වසර 3 කට වැඩි කාලයක් එකම ගිණුමේ පවතී. දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට බැංකුව විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2024 ට පෙර අවිනිශ්චිත ගිණුමේ සටහන් කර ඇති ශේෂයන්, නිසි යොමු කිරීම් නොමැති HSBC (අපගේ නිෂ්කාශන ගිණුම) හරහා ලැබුණු ගනුදෙනුකරුවන්ගේ තැන්පතුවලට අදාළ වේ. විවිධ උත්සාහයන් දැරුවද, මෙම ගනුදෙනු බැංකු නොවන ගනුදෙනුකරුවන් විසින් එකවර සිදු කරන ලද තැන්පතු විය හැකි බැවින්, අපට තැන්පත්කරුවන් සොයා ගැනීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, බැංකුවේ ගනුදෙනුකරුවන් විසින් කළ තැන්පතු, අපි සාර්ථකව හඳුනාගෙන විසඳා ඇත්තෙමු.<br><br>එංගලන්ත බැංකුව විසින් නව රෙගුලාසි හඳුන්වා දීමෙන් පසුව, අනාගතයේදී, එවැනි ගැටළු වළක්වා ගැනීම සඳහා තැන්පත්කරුවන් අවම මට්ටමේ තොරතුරු සැපයීමට දැන් අවශ්‍ය වේ. නියාමන අවශ්‍යතාවලට අනුකූලව, එංගලන්ත බැංකුව විසින් නම් කරන ලද පුණ්‍යායතනයකට මාරු කිරීමට පෙර අවම වශයෙන් වසර 15 ක් සඳහා මෙම හිමිකම් නොලබන තැන්පතු අප සතුව තබා ගත යුතුය. | අවිනිශ්චිත ණයහිමියන්ගේ ගිණුමේ දිගු කාලීන හිඟ ශේෂවල හිමිකරුවන් හඳුනා ගැනීමට සහ දිගු කාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට බැංකුව සිය උත්සාහයන් දිගටම කරගෙන යාම නිර්දේශ කෙරේ. |

**1.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

PRA විසින් එහි කාලානුරූපී සාරාංශ රැස්වීමේ (Periodic Summary Report- PSM) වාර්තාවල ඉස්මතු කර ඇති ප්‍රධාන කරුණු සහ එම ප්‍රධාන ගැටළුවලට අනුකූල වීම පහත සාරාංශ කර ඇත.

| වාර්තාවේ දිනය සහ ප්‍රධාන අවදානම හෝ අවදානම් ක්ෂේත්‍රය | PRA හි අදහස් දැක්වීම | බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් විසින් ලබාඇති ප්‍රගතිය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2022.02.12 දිනැති වාර්තාව | ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ආර්ථිකය සහ බැංකුවේ මව් බැංකුව මත රඳා නොසිටින | 2024 අගෝස්තු 09 දිනැති PSM වාර්තාවට අනුව, බාහිර පරිසරය හා | PRA විසින් ඔවුන්ගේ PSM ලිපියෙන් නිර්දේශ කරන ලද ක්‍රියාකළ යුතු | ව්‍යාපාර මාර්ග ඵලදායී ලෙස විවිධාංගීකරණය |

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපාර මොඩලයේ තිරසාරභාවය | තත්වයකට පත්වීම සහ එහි ව්‍යාපාර මාදිලි විවිධාංගීකරණය කිරීම සඳහා ක්‍රියාත්මක කරන උපාය මාර්ග දක්වා ඇති යාවත්කාලීන ව්‍යාපාර සැලැස්මක් බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් විසින් සපයා ඇත. නැගෙනහිර සහ අග්නිදිග ආසියාවේ වෙළඳ මූල්‍ය ව්‍යාපාර පැවැත්වීම සහ දැනට පවතින, එක්සත් රාජධානිය පදනම් කරගත් ව්‍යාපාර මාර්ග සංවර්ධනය කිරීම මෙයට ඇතුළත් වේ. | ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයන් සහ 'ව්‍යාපාර ආකෘති තිරසාරභාවය' යන දෙකම ප්‍රධාන අවදානම් කාණ්ඩයේ සිට අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර ලෙස පහත හෙලා ඇත. | කරුණු කිහිපයක් තිබේ. PRA විසින් අවශ්‍ය කරන ලද බොහෝ ක්‍රියාමාර්ග 2025.01.31 වන විට සම්පූර්ණ කර ඇත.<br><br>PRA වෙත පහත වාර්තා/ලේඛන ඉදිරිපත් කිරීමට තිබුණි.<br>a) අනුප්‍රාප්තික සැළැස්ම<br>b) 2025/2027 ව්‍යාපාර සැළැසුම<br>c) බැංකුවේ ව්‍යාපාර ආකෘතිය සඳහා උපායමාර්ගික මාරුවට හේතු<br><br>මේවා 2025.02.21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර අනුමත කරන ලදී. ලේඛන 2025.02.28 දින PRA වෙත ඉදිරිපත් කරන ලදී. | කිරීම සහතික කිරීම වෙනුවෙන් බැංකුව එහි යාවත්කාලීන කරන ලද උපායමාර්ගික සැළැස්ම ක්‍රියාත්මක කිරීම සමීපව අධීක්ෂණය කිරීම අඛණ්ඩව කරගෙන යාම සහ PRA සමඟ ක්‍රියාශීලී සන්නිවේදනයක් පවත්වා ගැනීමට සහ උපායමාර්ගික මුලපිරීම්වල ප්‍රගතිය හා නියාමන අපේක්ෂාවන්ට අනුකූල වීම පිළිබඳ කාලෝචිත යාවත්කාලීන කිරීම් සැපයීමට නිර්දේශ කෙරේ. |
| 2024.08.09 දිනැති වාර්තාව<br><br>**කළමනාකරණය හා පාලනය** | එක්සත් රාජධානියේ අනුබද්ධ සමාගම් සමූහයෙන් ස්වාධීන වීම පිළිබඳ අපගේ අපේක්ෂාවන් විදේශීය ශාඛා පිළිබඳව අප දරන අපේක්ෂාවන්ට වඩා සැලකිය යුතු හා ප්‍රමාණාත්මක වශයෙන් වෙනස් ය.<br><br>බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි විධායක තනතුරු පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණ ගන්නා තැනැත්තා බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලය බව PRA අවධාරණය කිරීමට ද කැමැත්තක් දක්වයි. | මෙම PSM වාර්තාවට අනුව, 2024 දෙසැම්බර් 20 දින වන විට, PRA වෙත ඉදිරිපත් කළ යුතු ක්‍රියාකාරකම්/වාර්තා සකස් කිරීමේ/ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටිමු. එම වාර්තා කිහිපයක් පහත පරිදි වේ.<br>• උගත් පාඩම් පිළිබඳ වාර්තාව (Lessons Learnt Report)<br>• යාවත්කාලීන කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුප්‍රාප්තික සැළැස්ම. | ණය පොතේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා එක්සත් රාජධානියේ වෙළඳපොළට ප්‍රමාණවත් නිරාවරණයක් සහ ණය පළපුරුද්දක් ඇති ණය අවදානම් කළමනාකරුවෙකු බඳවා ගැනීමේ ක්‍රියාවලියක BOC (UK) නිරතව සිටී. මෙම ක්‍රියාවලිය 2025.03.31 ට පෙර අවසන් කිරීම අපේක්ෂා කෙරේ. | නියාමන අපේක්ෂාවන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහා PRA ට අවශ්‍ය සියලුම වාර්තා සහ ක්‍රියාකාරකම් කාලෝචිත ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම සහතික කිරීමට බැංකුවට නිර්දේශ කෙරේ. |

එක්සත් රාජධානියේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් පත් කිරීම වැනි වැදගත් තීරණ ගනු ලබන්නේ එක්සත් රාජධානියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දෘෂ්ටිකෝණයෙන් පිටත හෝ නොතකා බව හා එය PRA හි බලයෙන් පිටත බව පැහැදිලි වුවහොත්, බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් විසින් එලදායී අධීක්ෂණයේ සීමා කොන්දේසිය සපුරාලීම දිගටම කරගෙන යනවාද යන්න PRA විසින් සලකා බලනු ලැබේ.

PRA හි මැදිහත්වීමකින් තොරව, සමූහය සමඟ එලදායී ලෙස සම්බන්ධ වී ගැටළු විසඳීමට එක්සත් රාජ්ධානියේ මණ්ඩලයට ඇති නොහැකියාව දුර්වලතාවයේ සලකුණක් ලෙස අපි සලකමු. මෙම වසර මුලදී සිදුවීම් සලකා බලා බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් විසින් "උගත් පාඩම්" අභ්‍යාසයක් සිදුකර එහි ප්‍රතිඵල PRA සමඟ බෙදා ගැනීම සිදු කිරීමට අපි කැමැත්තෙමු.

බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි ජ්‍යෙෂ්ඨ තනතුරුවල අධික සේවක පිරිවැටුමක් ඇතිවීමේ හැකියාව පිළිබඳව PRA සැලකිලිමත් වේ. ප්‍රධාන විධායක නිලධාරී, සභාපති සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු ඇතුළු ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් අනුප්‍රාප්තිකයන් බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් විසින් දක්ෂ ලෙස හැසිරවිය යුතුය. විධායක වගකීම් භාරදීමේ ප්‍රමාණවත් කාලයක් ඇතුළුව සුමට අනුප්‍රාප්තික ක්‍රියාවලියක් බැංකුවේ ස්ථාවරත්වය සඳහා ඉතා

| | | | | |
|---|---|---|---|---|
| | වැදගත් වේ. ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යය සඳහා සුමට භාරදීමක් විශේෂයෙන් වැදගත් වන අතර එබැවින්, ප්‍රධාන විධායක නිලධාරියාගේ ද්විතීයීය පදනම මත සිටින කාලය සඳහා දීර්ඝ කිරීම/කිරීම් සුදුසු ලෙස භාවිතා කිරීම අපි අගය කරන්නෙමු. එක්සත් රාජධානියේ බැංකුවකින් ද්විතීයීය පදනම මත සිටින කාර්ය මණ්ඩල සාමාජිකයෙකු නැවත කැඳවීම සමූහයට අවශ්‍ය විය හැකි බව PRA පිළිගනී. තවද, මෙම ක්‍රියාවලිය නිසි සංවේදීතාවයෙන් සහ එක්සත් රාජධානියේ බැංකුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ කාර්යභාරය ගැන සැලකිලිමත් වෙමින් හසුරුවනු ඇතැයි අපි අපේක්ෂා කරමු. එක්සත් රාජධානියේ බැංකුවේ අනුප්‍රාප්තික සැලැස්ම සහ විශේෂයෙන් ද්විතීයික පදනම මත සිටින කාර්ය මණ්ඩලය සඳහා සමූහය සමඟ සම්බන්ධ වී, සාධාරණ ලෙස කළ හැකි සෑම දෙයක්ම කිරීමට අපි එක්සත් රාජධානියේ බැංකුව දිරිමත් කිරීමට කැමැත්තෙමු. බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හට මෙය කිරීමට අවස්ථාව ලැබුණු පසු, යාවත්කාලීන කළ අධ්‍යක්ෂ මණ්ඩල අනුප්‍රාප්ති සැලැස්මක් අපට අවශ්‍ය වනු ඇත. | | | |
| ණය අවදානම (**Credit Risk**) | සමස්තයක් ලෙස, අපි බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි ණය විශ්ලේෂණය දුර්වල ගුණාත්මක බවක් බව තක්සේරු කළෙමු. ආයතනයට නිරාවරණයන්හි ස්වභාවය පිළිබඳ අවබෝධයක් නොමැතිකම පෙන්නුම් කර ඇත. උදා: | -එම- | දැනට බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් සතුව අක්‍රීය අත්තිකාරම් පහසුකම් නොමැත. | සියලු නිරාවරණ වර්ග පිළිබඳ පුළුල් අවබෝධයක් සහතික කිරීමෙන් එහි ණය විශ්ලේෂණ රාමුව ශක්තිමත් කිරීමට නිර්දේශ කෙරේ. බැංකුව තම |

| | | | |
|---|---|---|---|
| සංවෘත සහ විවෘත පාලමක් (bridge) යනු කුමක්ද, බැංකුවේ ආතති-පරීක්ෂණ ක්‍රමවේදයේ දුර්වලතා, උදා: වෙනත් ණය සම්බන්ධ ගැටලු අතර පොලී අනුපාත ආතති-පරීක්ෂාවක් නොමැතිකම සහ ඉදිකිරීම් / සංවර්ධනය හා විවෘත පාලම් මූල්‍ය පහසුකම් සඳහා අවදානම් බරතැබීම්වල වැරදි ලෙස භාවිතය | | | තැන්පත්කරුවන් ගේ පදනම පුළුල් කිරීම සහ සීමිත අරමුදල් ප්‍රභවයන් මත යැපීම අඩු කිරීම සඳහා දිගුකාලීන අරමුදල් උපාය මාර්ගයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම දිගටම කරගෙන යා යුතුය. |
| අපගේ සමාලෝචනයේදී, වැඩිවන ණය කළඹ ආවරණය කිරීම සඳහා බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් සිය තැන්පතු පදනම වර්ධනය කර ගැනීමට උත්සාහ කරන බව ද නිරීක්ෂණය විය. මෙය බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි වත්කම් වගකීම් කමිටුවේ (ALCO) සංදේශයෙන් නිරීක්ෂණය විය. එහිදී සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය "විශාල ලෙස අඩු" ලෙස විස්තර කර තිබුණු අතර "සංවිධානයේ ස්ථාවරත්වය සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා උපායමාර්ගික ක්‍රියාමාර්ග" අවශ්‍ය විය. | | දැනට බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි ද්‍රවශීලතා අනුපාතය නියාමන අවශ්‍යතාවයන්ට වඩා සැලකිය යුතු ඉහළින් පවතියි. | එක්සත් රාජධානියේ ණය දීමේ වෙළඳපොළේ සංකීර්ණතා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් විශේෂඥතාවයක් පවතින බව සහතික කිරීම සඳහා බැංකුව, එහි ජ්‍යෙෂ්ඨ ණය තීරණ ගැනීමේ කණ්ඩායම තුළ ඇති ඕනෑම ශක්‍යතා හිඩැසක් තක්සේරු කර ඒවාට විසඳුම් ලබා දිය යුතුය. |
| ආයතනයට ප්‍රමාණවත් ද්‍රවශීල සම්පත් මට්ටම් හා විචක්ෂණශීලී අරමුදල් මූලාශ්‍ර තිබීම සහ ද්‍රවශීලතාවය හා අරමුදල් අවදානම් පුළුල් ලෙස කළමනාකරණය කර පාලනය කිරීම අපි අපේක්ෂා කරමු. විශේෂයෙන්ම, නව ණය/ගනුදෙනු ලබා ගැනීම සඳහා ගනුදෙනු මාර්ගයකින් අරමුදල් සැපයීම සඳහා බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හට අවශ්‍ය ද්‍රවශීලතාවයක් පවතීවි යැයි අපි අපේක්ෂා කරමු. | | වර්තමානයේ, නව ණය/ගනුදෙනු ලබා ගැනීම සඳහා ණය දීමේ මාර්ගය සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් සතුව ඇත. | |
| බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් සඳහා වන ණය කාර්යභාරය හා වගකීම් | | 2025 පළමු කාර්තුව තුළ එක්සත් රාජධානියේ දේපළ | |

| | |
|---|---|
| පිළිබඳව කළ සමාලෝචනයක් මඟින් පෙන්නුම් කළේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට එක්සත් රාජධානියේ දේපල මූල්‍යකරණයේ ප්‍රමාණවත් විශේෂඥතාවයක් පෙන්නුම් නොකළ බව සහ ණය පිළිබඳව PRA විමසීම් සඳහා වන ඇතැම් පිළිතුරු සෑහීමකට පත් නොවන බවත්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ විශේෂඥතාව තවදුරටත් ප්‍රශ්න කළ හැකි බවත් නිරීක්ෂණය විය. | වෙළඳපොළ සහ අනෙකුත් අදාළ ණය කළමනාකරණ පිළිවෙත් පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා පුහුණුව සංවිධානය කිරීමේ ක්‍රියාවලියක බැංක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් නිරතව සිටියි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය GBP 327,000 ක ලාභයක් වූ අතර පෙර වර්ෂයේ අනුරූප ලාභය GBP 889,000 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ GBP 562,000 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට හේතු වූයේ, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචන වර්ෂයේදී විදේශ විනිමය ගනුදෙනුවලින් වන ශුද්ධ ලාභය GBP 324,000 කින් අඩුවීම, කාර්ය මණ්ඩල හා මෙහෙයුම් වියදම් පිළිවෙලින් GBP 157,000 කින් හා GBP 193,000 කින් වැඩිවීමයි.

**2.2 ඉකුත් වර්ෂ 10 ක කාලය තුළ ලාභදායිතාවය විශ්ලේෂණය**

පසුගිය වසර 10 ක කාලය තුළ**,** බැංකුව, 2014, 2015, 2016, 2020 **සහ** 2022 යන වර්ෂ සඳහා අලාභ වාර්තා කර ඇති අතර**,** 2017, 2018, 2019 **සහ** 2021 යන වසර සඳහා ආන්තික ලාභයක් වාර්තා කර ඇත. තවද**,** පසුගිය වසර 10 ක කාලය තුළ බැංකුව අඛණ්ඩව සමුච්චිත අලාභ වාර්තා කර ඇති බවත්**,** එම නිසා 2010 දී එය ආරම්භ කළ දා සිට එහි මව් සමාගමට ලාභාංශ ගෙවීමට නොහැකි වූ බවත් නිරීක්ෂණය විය.

**සංඛ්‍යා ස්ටර්ලින් පවුම් වලිනි**

| වර්ෂය | බදු පෙර ලාභය/(අලාභය) | බදු පසු ලාභය/ (අලාභය) | සමුච්ඡිත ලාභය/ (අලාභය) |
|---|---|---|---|
| 2024 | 412,000 | 327,000 | (966,000) |
| 2023 | 1,068,000 | 889,000 | (1,293,000) |
| 2022 | (147,000) | (146,000) | (1,989,000) |
| 2021 | 114,000 | 112,000 | (1,843,000) |
| 2020 | (26,000) | (23,000) | (1,955,000) |
| 2019 | 108,000 | 105,000 | (1,932,000) |
| 2018 | 85,000 | 85,000 | (2,037,000) |
| 2017 | 18,000 | 18,000 | (2,087,000) |
| 2016 | (123,000) | (123,000) | (2,105,000) |
| 2015 | (312,000) | (312,000) | (1,982,000) |
| 2014 | (596,000) | (596,000) | (1,669,000) |

## 2.3 බැංකුවේ ප්‍රධාන ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම්වල ප්‍රවණතා විශ්ලේෂණය

2024 සැප්තැම්බර් 30 දිනට හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා ප්‍රධාන ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම්වල ප්‍රවණතා විශ්ලේෂණය ප්‍රතිශතයන්ගේ වැඩිවීම හා අඩුවීම සමඟ පහත දැක්වේ.

**ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්**

| | අවසාන දිනට | | සංඛ්‍යා ස්ටර්ලින් පවුම් වලිනි. | | |
|---|---|---|---|---|---|
| **විස්තරය** | **2024.09.30** | **2023.12.31** | **2022.12.31** | **2021.12.31** | **2020.12.31** |
| ණය සහ අත්තිකාරම්වලින් ලද පොලී ආදායම | 2,133,706.62 | 1,414,292.80 | 1,073,580.58 | 929,227.70 | 878,532.16 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 51% | 32% | 16% | 6% | - |
| බිල්පත් වට්ටම් කිරීමෙන් ලද පොලී ආදායම | 222,000.81 | 187,563.57 | 323,195.60 | 78,559.29 | 45,368.16 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 18% | (42%) | 311% | 73% | - |
| මුදල් වෙළඳපොල කටයුතුවලින් ලද ශුද්ධ පොලිය | 290,092.09 | 804,335.66 | 404,772.71 | 285,551.78 | 138,119.20 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (64%) | 99% | 42% | 107% | - |
| ආයෝජනවලින් ලද පොලී ආදායම | 54,249.63 | 6,651.71 | 20,472.62 | 197,148.41 | 306,017.57 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 716% | (68%) | (90%) | (36%) | - |
| විදේශ විනිමය ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභය | 74,490.49 | 421,289.28 | 193,318.12 | 50,287.62 | 119,255.60 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (82%) | 118% | 284% | (58%) | - |
| කොමිස් ආදායම | 426,654.58 | 530,188.13 | 474,037.97 | 360,935.77 | 634,488.48 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (20%) | 12% | 31% | (43%) | - |
| පොලී වියදම | 1,041,076.26 | 218,776.50 | 112,951.18 | 10,129.28 | 9,084.66 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 376% | 94% | 1015% | 11% | - |
| හානිකරණ ප්‍රතිපාදනය | - | 290,483.00 | 404,863.00 | 59,235.00 | 196,339.00 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (100%) | (28%) | 583% | (70%) | - |
| පිරිස් වියදම් | 1,024,945.88 | 1,300,696.43 | 1,125,647.65 | 1,084,742.46 | 1,112,297.31 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (21%) | 16% | 4% | (2%) | - |
| මෙහෙයුම් වියදම් | 806,718.57 | 940,000.00 | 878,145.56 | 722,745.04 | 766,000.00 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (14%) | 7% | 22% | (6%) | - |
| බදු පෙර ලාභය | 236,382.05 | 1,067,940.44 | (147,000.00) | 114,000.00 | (26,000.00) |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (78%) | 826% | (229%) | 538% | - |

ප්‍රධාන වත්කම් හා වගකීම් අයිතම

| විස්තරය | 2024.09.30 | 2023.12.31 | 2022.12.31 | 2021.12.31 | 2020.12.31 | 2019.12.31 |
|---|---|---|---|---|---|---|
| | අවසාන දිනට | | | සංඛ්‍යා ස්ටර්ලින් පවුම් වලිනි. | | |
| **වත්කම්** | | | | | | |
| අතැති මුදල් | 30,000 | 33,000 | 39,000 | 49,000 | 57,000 | 52,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (9%) | (15%) | (20%) | (14%) | 10% | - |
| බැංකු ශේෂය නොස්ට්‍රෝ | 3,276,000 | 6,896,000 | 3,105,000 | 2,817,000 | 1,882,000 | 718,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | -52% | 122% | 10% | 50% | 162% | - |
| එංගලන්ත බැංකුවේ සංචිත ගිණුම | 104,600,000 | 108,173,000 | 83,615,000 | 17,850,000 | 106,220,000 | 131,800,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (4%) | 30% | 368% | (83%) | (19%) | - |
| **ණය සහ අත්තිකරාම්** | | | | | | |
| අනේවාසික විදේශ ව්‍යවහාර ණය | 445,000 | 253,000 | 600,000 | 480,000 | 196,000 | 1,451,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 76% | (58%) | 25% | 145% | (86%) | - |
| කාර්යය මණ්ඩල ණය | 69,000 | 47,000 | 31,000 | 12,000 | 9,000 | - |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 47% | 52% | 158% | 33% | 100% | - |
| ව්‍යාපාර ණය | 7,046,000 | 3,289,000 | 3,490,000 | 3,397,000 | 3,600,000 | 4,462,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 114% | (6%) | 3% | (6%) | (19%) | - |
| උකසට දීමට ගන්නා දේපළ සඳහා ණය (Buy to Let Mortgage Loans) | 29,203,000 | 22,340,000 | 10,454,000 | 12,129,000 | 12,452,000 | 10,997,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 31% | 114% | (14%) | (3%) | 13% | - |
| එකතු මූල්‍ය (Bridge Finance) | 4,339,000 | - | - | - | - | - |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 100% | | | | | |
| මිශ්‍ර වාණිජ ණය | 10,934,000 | 7,388,000 | 2,971,000 | 2,179,000 | 2,023,000 | - |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 48% | 149% | 36% | 8% | 100% | - |
| අයිරාවන් | 1,265,000 | 715,000 | 550,000 | 1,162,000 | 2,084,000 | 667,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 77% | 30% | -53% | (44%) | 212% | - |
| | **53,301,000** | **34,032,000** | **18,096,000** | **19,359,000** | **20,364,000** | **17,577,000** |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 57% | 88% | (7%) | (5%) | 16% | - |
| ආයෝජන | 2,147,000 | 435,000 | 453,000 | 1,499,000 | 3,139,000 | 4,798,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී | 394% | (4%) | (70%) | (52%) | (35%) | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිශතාත්මක (%) වෙනස | | | | | | |
| ස්ථාවර වත්කම් | 3,814,000 | 3,834,000 | 3,461,000 | 3,585,000 | 3,713,000 | 2,999,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (1%) | 11% | (3%) | (3%) | 24% | - |
| **වගකීම්** | | | | | | |
| තැන්පතු | | | | | | |
| ජංගම ගිණුම් | 3,609,000 | 2,300,000 | 2,716,000 | 2,460,000 | 2,391,000 | 4,474,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 57% | (15%) | 10% | 3% | (47%) | |
| ස්ථාවර තැන්පතු | 3,060,000 | 1,096,000 | 510,000 | 485,000 | 489,000 | 402,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 179% | 115% | 5% | (1%) | 22% | |
| රේසින් (Raisin) ස්ථාවර තැන්පතු | 28,748,000 | 13,873,000 | 5,956,000 | - | - | - |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 107% | 133% | 100% | - | - | - |
| ඒක්ෂණ (Call) තැන්පතු | 11,000 | 23,000 | 59,000 | 35,000 | 60,000 | 62,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (52%) | (61%) | 69% | (42%) | (3%) | - |
| ඉතිරි කිරීමේ ගිණුම | 2,185,000 | 1,937,000 | 2,186,000 | 2,831,000 | 1,792,000 | 1,607,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 13% | (11%) | (23%) | 58% | 12% | - |
| | **37,613,000** | **19,229,000** | **11,427,000** | **5,811,000** | **4,732,000** | **6,545,000** |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 96% | 68% | 97% | 23% | (28%) | - |
| වොස්ට්‍රෝ ගිණුම | 7,749,000 | 5,066,000 | 15,167,000 | 3,415,000 | 3,550,000 | 3,872,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 53% | (67%) | 344% | (4%) | (8%) | - |
| මුදල් වෙළඳපොල තැන්පතු (කෙටි කාලීන) | 107,864,000 | 98,429,000 | 52,013,000 | 6,874,000 | 103,000,000 | 128,071,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | 10% | 89% | 657% | (93%) | (20%) | - |
| මුදල් වෙළඳපොල තැන්පතු (කාලීන) | 15,337,000 | 15,794,000 | 17,488,000 | 17,834,000 | 17,283,000 | 17,448,000 |
| පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ප්‍රතිශතාත්මක (%) වෙනස | (3%) | (10%) | (2%) | 3% | (1%) | - |

(i) 2020 සහ 2022 කාලය තුළ බැංකුව බදු වලට පෙර පාඩු වාර්තා කර ඇති අතර, එමඟින් බැංකුවේ සමුච්චිත පාඩු වැඩිවීමට හේතු විය. කෙසේ වෙතත්, 2023 මූල්‍ය වර්ෂය තුළ බැංකුවට බදු වලට පෙර ලාභය GBP 1,067,940 ක් ලෙස උපයා ගැනීමට හැකි වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොලී ආදායම, මුදල් වෙළඳපොළ මෙහෙයුම් වලින් ලැබෙන පොලී ආදායම, විදේශ විනිමය ගනුදෙනු වලින් ලැබෙන ශුද්ධ ලාභය සහ කොමිස් ආදායම වැඩිවීමයි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

බැංකුව වසර ගණනාවක් තිස්සේ ප්‍රාග්ධනීකරණය අඩු තත්වයකට මුහුණ දී ඇති අතර, ප්‍රධාන වශයෙන් වෙළඳ මූල්‍ය ක්‍රියාකාරකම් සහ සීමිත එක්සත් රාජධානියේ ණය මත විශ්වාසය තබා ඇති අතර, මව් සමාගමෙන් එහි කොටස් සහ දිගු කාලීන තැන්පතු හරහා අරමුදල් සපයන ලදී. සීමිත අරමුදල් ලබා ගැනීමේ හැකියාව, සීමිත ණය දීමේ ධාරිතාව සහ මව් සමාගම විසින් දිගුකාලීන තැන්පතු සඳහා අය කරන ලද පොලී අනුපාත ණය දීම සඳහා තරඟකාරී නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජනනය කරන ලද ආදායම අවම ස්ථාවර වියදම් ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවූ අතර, එය අඛණ්ඩ පාඩු වලට හේතු විය.

2020 න් පසු බැංකුව, දේශීය ගනුදෙනුකරුවන්ගෙන් එක්සත් රාජධානියේ තැන්පතු රැස් කිරීම සඳහා තැන්පතු වේදිකා එකතු කරන්නෙකු වන Raisin සමඟ හවුල් විය. මෙම අරමුදල් තරඟකාරී අනුපාත යටතේ අවශ්‍ය ද්‍රවශීලතාවය සපයා ඇති අතර, එමඟින් එක්සත් රාජධානියේ වෙළඳපොලේ ණය දීම වැඩි කිරීමට හැකි වී තිබේ. මෙය, අනෙක් අතට, ඉහළ ණය දීමේ පරිමාවන්ට සහාය වී ඇති අතර, වඩාත් තිරසාර මට්ටමේ ලාභදායිතාවයකට දායක වී ඇත.

(ii) 2023 වර්ෂයේදී ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොලී ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 32 කින් ඉහළ ගොස් ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023 වර්ෂයේදී ණය සහ අත්තිකාරම් පෙර වසරට සාපේක්ෂව සියයට 88 කින් වැඩිවීමයි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**
නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(iii) 2023 වර්ෂය තුළ ණය සහ අත්තිකාරම් ශේෂය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 114 ක සහ සියයට 149 ක වැඩිවීමක් වාර්තා කළ, මිලදී ගැනීමට ඉඩ දෙන උකස් සහ මිශ්‍ර වාණිජ ණය යන ණය කාණ්ඩවල වැඩිවීමයි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(iv) 2024 වර්ෂය තුළ බැංකුව "බ්‍රිජ් ෆිනෑන්ස්" නමින් නව ණය වර්ගයක් හඳුන්වා දී ඇති අතර, 2024 සැප්තැම්බර් 30 වන විට ස්ටර්ලින් පවුම් 4,339,000 ක ණය ශේෂයක් වාර්තා කර ඇත.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**
නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(v) බැංකුවේ මුළු පොලී ආශ්‍රිත ආදායමෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ බැංකුවේ ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොලී ආදායමෙනි. 2021 මූල්‍ය වර්ෂයේ සිට ණය සහ අත්තිකාරම් වලින් ලැබෙන පොලී ආදායමේ ක්‍රමයෙන් වැඩිවීමක් දක්නට ලැබුණි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(vi) එංගලන්ත බැංකුවේ සංචිත ගිණුම මඟින්, එංගලන්ත බැංකුව සමඟ එක් දින GBP මුදල් වෙළඳපොළේ කරන ලද ආයෝජනය පෙන්වයි. ආයෝජනයෙන් වැඩි ප්‍රමාණයක් මව් බැංකුවෙන් ලැබුණු මුදල් වලින් සිදු කර ඇති අතර, සුළු කොටසක් බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් වෙතින් වේ. පෙර වසර හා සසඳන විට 2023 වර්ෂය තුළ බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි GBP ආයෝජනය සඳහා ලැබුණු ශුද්ධ පොලී ආදායම සියයට 99 කින් වැඩි වී තිබේ.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**
නිරීක්ෂණය සමඟ එකඟ වේ.
2022 වසරට සාපේක්ෂව 2023 දී පොලී ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2022 සහ 2023 කාලය තුළ මූලික අනුපාත ඉහළ යාමයි. 2023 ආරම්භයේදී 3.50% ක් වූ මූලික අනුපාතය වසර අවසන් වන විට 5.25% දක්වා ඉහළ ගොස් ඇති අතර එය ඉහළ පොලී ඉපැයීම් සඳහා දායක විය.

(vii) 2023 වර්ෂය තුළ බැංකුවේ පොලී වියදම ද සියයට 94 කින් ඉහළ ගොස් ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෙර වසරට සාපේක්ෂව බැංකුවේ තැන්පතු පදනම සියයට 68 කින් වැඩිවීමයි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**
නිරීක්ෂණය සමඟ එකඟ වේ

2022 පාදක වර්ෂයට සාපේක්ෂව 2023 දී පොලී වියදම් සැලකිය යුතු ලෙස වැඩිවීමට ප්‍රධාන හේතු වන්නේ:

2022 දී, එංගලන්ත බැංකුවේ (BOE) මූලික අනුපාතය වසර ආරම්භයේදී සියයට 0.25 සිට වසර අවසන් වන විට සියයට 3.5 දක්වා ඉහළ ගියේය. මෙම වැඩිවීම් ක්‍රමයෙන් ක්‍රියාත්මක කරන ලද අතර, සෑම මසකම පදනම් ලකුණු 25 (bps) කින් අනුපාත වැඩිවීම් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 සඳහා සාමාන්‍ය පොලී අනුපාතය ආසන්න වශයෙන් සියයට 2 ක් විය.
2023 දී, එංගලන්ත බැංකුවේ මූලික අනුපාතය සියයට 3.5 කින් ආරම්භ වී අගෝස්තු වන විට සියයට 5.25 දක්වා ඉහළ ගියේය. 2023 සඳහා සාමාන්‍ය පොලී අනුපාතය සියයට 4.25 ක් පමණ විය.
මෙම ඉහළ සාමාන්‍ය පොලී අනුපාතය සහ ශේෂ පත්‍රයේ වර්ධනයට සහාය වීම සඳහා ණය ගැනීම් වැඩිවීම යන දෙකෙහිම එකතුව පොලී වියදම් ඉහළ යාමට ප්‍රධාන හේතු විය.

(viii) 2023 වර්ෂය තුළ බැංකුවේ තැන්පතු පදනමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බැංකුවේ Raisin තැන්පතු සහ ස්ථාවර තැන්පතු වල වැඩිවීමයි. එය පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 133 ක සහ සියයට 115 ක වර්ධනයක් වාර්තා කළේය.

කළමනාකරණයේ අදහස් දැක්වීම
නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(ix) 2021 වසර අවසානයේ සිට "Raisin " වේදිකාව හරහා තැන්පතු එකතු කිරීමට බැංකුවට හැකි වූ අතර, ඒ හරහා එකතු කරන ලද තැන්පතු 2023 සහ 2024 වසරවල බැංකුවේ මුළු තැන්පතු කළඹෙන් සියයට 70 කට වඩා නියෝජනය විය.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**
නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(x) ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩලයට ලබා දුන් වැටුප් වර්ධක සහ සිදු කරන ලද ප්‍රසාද දීමනා ගෙවීම හේතුවෙන්, 2023 වර්ෂය තුළ බැංකුවේ කාර්ය මණ්ඩල වියදම ද පෙර වසරට සාපේක්ෂව සියයට 16 කින් ඉහළ ගොස් තිබේ.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**
නිරීක්ෂණය සමඟ එකඟ වේ.

එක්සත් රාජධානියේ රජය පැයක අනුපාතය ගැලපීම, කළමනාකරණ මට්ටම්වලට කුසලතා සහිත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ලන්ඩන් නගරයේ බර තැබීමේ දීමනාව වැඩි කිරීම සහ ප්‍රසාද දීමනාවක් ගෙවීම ඇතුළු සාධක කිහිපයක් මෙම වැඩිවීමට හේතු වී ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මතභේදාත්මක ස්වභාවයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **හිටපු ප්‍රධාන විධායක නිලධාරියාගේ ධූර කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ (INEDs) සැලකිය යුතු මැදිහත්වීම**<br><br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (INEDs) එවකට ප්‍රධාන විධායක නිලධාරියාගේ ධූර කාලය තවත් කාලයක් දීර්ඝ කිරීමට සැලකිය යුතු උත්සාහයක් ගෙන ඇති බව විගණනය අතරතුරදී නිරීක්ෂණය විය.<br><br>2023 මැයි 04 දිනැති INEDs දෙදෙනෙකු විසින් සකස් කරන ලද සහ කොළඹ BOC සභාපතිවරයාට විද්‍යුත් තැපෑලෙන් යවන ලද අනුප්‍රාප්තික සැලසුම් ලේඛනයට අනුව, එවකට ප්‍රධාන විධායක නිලධාරියාගේ ධූර කාලය, INEDs ගේ ධූර කාලය දීර්ග කිරීමට සමගාමීව 2026 මැයි දක්වා තවත් වසර දෙකක් සඳහා දීර්ඝ කිරීමට එක්සත් රාජධානියේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස ඔවුන්ට අදහසක් ඇති බව සඳහන් විය. | නිරීක්ෂණය සටහන් කරගන්නා ලදි. | ප්‍රධාන විධායක නිලධාරී පත්වීම් සහ දීර්ඝ කිරීම් සඳහා වන පාලන ක්‍රියාවලිය ස්වාධීනව, අරමුණුගත සහ විය හැකි ළබැදියාවන් පිළිබඳ ගැටුම් වලින් තොරව පවතින බව බැංකුව සහතික කිරීම නිර්දේශ කෙරේ. විධායක අනුප්‍රාප්ති සැලසුම් තීරණ වලදී INEDs ගේ කාර්යභාරය සහ සීමාවන් ගෙනහැර දක්වන පැහැදිලි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය සලකා බැලිය යුතුය. |
| (ii) | තවද, 2024 පෙබරවාරි 14 දිනැති INEDs විසින් BOC (UK) හි “ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ” යන තේමාව යටතේ BOC කොළඹ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත යොමු කරන ලද ලිපියේ, එවකට ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සේවා කාලය තවත් වසර දෙකක් සඳහා දීර්ඝ කිරීමට දැඩි ලෙස නිර්දේශ කර ඇති අතර, සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ පස් දෙනාගෙන් කිසිවෙකු BOC (UK) හි ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කිරීමට ඔවුන් සහාය නොදක්වන බව ද සඳහන් කර ඇත. | එවකට ප්‍රධාන විධායක නිලධාරියාගේ ධූර කාලය තවත් වසර 2 කට දීර්ඝ කරන ලෙස INEDs විසින් BOC අධ්‍යක්ෂ මණ්ඩලයෙන් දැඩි ලෙස ඉල්ලා සිටි බව සටහන් විය. එම කරුණ මත පදනම්ව, සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ පස් දෙනාගෙන් කිසිවෙකු BOC (UK) හි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට INEDs සහාය නොදැක්වූ බව ද සටහන් විය. | |
| (iii) | තවද, INEDs විසින් BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද | නිරීක්ෂණය සටහන් කර | |

| | | | |
|---|---|---|---|
| | 2024 මාර්තු 07 සහ 2024 මාර්තු 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින්, අනුප්‍රාප්තිකයෙකුට රාජකාරි සම්පූර්ණයෙන්ම පැවරීම සඳහා එවකට ප්‍රධාන විධායක නිලධාරියාගේ සේවා කාලය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවය අඛණ්ඩව අවධාරණය කළේය. | ගන්නා ලදි.<br><br>රාජකාරී පැවරීමක් සඳහා එවකට ප්‍රධාන විධායක නිලධාරියාගේ දිගුව පිළිබඳව INEDs අඛණ්ඩව අවධාරණය කළහ.<br><br>එවකට ප්‍රධාන විධායක නිලධාරියාගේ දිගුව තවත් වසර 2 කට දීර්ඝ කරන ලෙස INEDs විසින් BOC අධ්‍යක්ෂ මණ්ඩලයෙන් දැඩි ලෙස ඉල්ලා තිබුණි. එය මත පදනම්ව, සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ පස් දෙනාගෙන් කිසිවෙකු BOC (UK) හි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට INEDs සහාය නොදැක්වූ බව ද සටහන් විය. | |
| **(iv)** | **හිටපු ප්‍රධාන විධායක නිලධාරියාට විශේෂ ප්‍රසාද දීමනාවක් ගෙවීම සඳහා INEDs හි විශේෂ මැදිහත්වීම**<br><br>2023 වර්ෂය තුළ අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරයක් මධ්‍යයේ අත්පත් කරගත් සුවිශේෂී මූල්‍ය කාර්ය සාධනයට අනුකූලව, සංදේශයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, BOC (UK) හි සියලුම කාර්ය මණ්ඩලයට දිරි දීමනාවක් / ප්‍රසාද දීමනාවක් ලෙස මාසයක දළ වැටුපක් ගෙවීම සඳහා 2023 දෙසැම්බර් 05 දිනැති සංදේශයක් BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. එම කොන්දේසිවලින් එකක් වූයේ යෝජිත මාසයක දළ වැටුපට සමාන ප්‍රසාද දීමනාව සියලුම ස්ථිර කාර්ය මණ්ඩලයට සහ ද්විතීයික කාර්ය මණ්ඩලය සඳහා සුදුසුකම් ලබන බවයි. ඒ අනුව, එවකට බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ද ද්විතීයික කාර්ය මණ්ඩල කාණ්ඩයට අයත් වන අතර, ඉහත සංදේශයට අනුව ප්‍රසාද දීමනාවක් ලෙස මාසයක දළ වැටුපට හිමිකම් ලබයි. | 2023 දෙසැම්බර් 05 දිනැති සංදේශයට අනුව, සියලුම ස්ථිර සහ ද්විතීයික කාර්ය මණ්ඩලය මාසයක දළ වැටුපක ප්‍රසාද දීමනාවක් සඳහා සුදුසුකම් ලබා ඇත. ද්විතීයික කාර්ය මණ්ඩලයේ කෙනෙකු ලෙස ලෙස අරුණ කුමාර මහතා මෙම ප්‍රසාද දීමනාවට හිමිකම් ලබයි. ඊට අමතරව, INEDs විසින් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද තවත් සංදේශයකින් පසුව, BOC (UK) හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විශේෂ ප්‍රසාද දීමනාවක් අරුණ කුමාර මහතාට ප්‍රදානය කරන ලදී. | විධායක කළමනාකාරිත්වයට කරනු ලබන ඕනෑම විශේෂ ගෙවීම් ශක්තිමත් සාධාරණීකරණයකට යටත් වන බවටත්, ස්වාධීන වේතන කමිටුවක් මගින් සමාලෝචනය කරන බවටත්, සම්පූර්ණ විනිවිදභාවය සහතික කරන බවටත් බැංකුව පැහැදිලි ප්‍රතිපත්ති ස්ථාපිත කළ යුතුය.<br><br>එසේම, INEDs ගේ භූමිකාවන් සහ ක්‍රියාවන් සුදුසු සීමාවන් තුළ පවතින බවත්, ඔවුන්ගේ ස්වාධීනත්වයට හානියක් නොවන බවත් සහතික කිරීම සඳහා, වේතන තීරණ සම්බන්ධයෙන් බැංකුව එහි පාලන රාමුව සමාලෝචනය කළ යුතුය. |

කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 18 වන දින පැවති BOC UK අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, INEDs දෙදෙනා විසින් ප්‍රධාන විධායක නිලධාරියා සඳහා විශේෂ ප්‍රසාද දීමනාවක් නිර්දේශ කළ අතර, අනුමැතිය  සඳහා පත්‍රිකාවක් යොමු කරන ලෙස හා  කොළඹ BOC කොළඹ අධ්‍යක්ෂ මණ්ඩලයට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් දෙන ලදි.

තවද, එක් INEDs අයෙක්, 2023 දෙසැම්බර් 28 දිනැති "ප්‍රධාන විධායක නිලධාරියා සඳහා විශේෂ ප්‍රසාද දීමනාව" යන මාතෘකාව යටතේ ලිපියක් සකස් කර ඇති අතර, ඔහුගේ සාර්ථක ජයග්‍රහණ පිළිගැනීමක් ලෙස, කාර්ය මණ්ඩලයට  එකඟ වූ ප්‍රසාද දීමනාවට අමතරව, හිටපු ප්‍රධාන විධායක නිලධාරියාට විශේෂ ප්‍රසාද දීමනාවක් ගෙවීමට නිර්දේශ කර ඇත.

මෙම යෝජනාවට BOC (UK) හි සියලුම අධ්‍යක්ෂවරුන් සහාය දක්වා ඇති අතර, INEDs ගෙන් එක් අයෙක් "දැඩි ලෙස සහාය දක්වයි" යනුවෙන් ප්‍රකාශ කරමින් මෙම යෝජනාව අනුමත කර ඇත.

BOC (UK) හි කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය ක්‍රියාත්මක කිරීම සඳහා 2024 දෙසැම්බර් 02 දිනැති මණ්ඩල පත්‍රිකාවට අනුව, ප්‍රධාන විධායක නිලධාරියාගේ වාර්ෂික දළ වැටුප ස්ටර්ලින් පවුම් 93,722 ක් වූ අතර, ඒ අනුව ප්‍රධාන විධායක නිලධාරී ප්‍රසාද දීමනාව මාසික දළ වැටුපට වඩා තුන් ගුණයකට වඩා වැඩි වූව ද,  අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලයට මසක වැටුප ප්‍රසාද දීමනාවක් ලෙස ගෙවන ලදි. ඒ අනුව, INEDs විසින් එවැනි තීරණයක් ආරම්භ කිරීම සහ සහභාගී වීම ඔවුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ සැකයක් ඇති කරයි.

## 3.2 එක්සත් රාජධානියේ BOC අධ්‍යක්ෂ මණ්ඩලයට කොළඹ BOC වෙතින් යෝජිත නියෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(i)** | 2016 මාර්තු මාසයේදී PRA විසින් නිකුත් කරන ලද SS5/2016 අධීක්ෂණ ප්‍රකාශයේ 5 වන වගන්තියට අනුව, "ලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන්, ස්ථාපිත හොඳම පිළිවෙත නම්, සභාපතිවරයා හැර, මණ්ඩලයෙන් අවම වශයෙන් අඩක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. නමුත්, කුඩා සමාගම් පවා අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකුවත් සිටින බව සහතික කළ යුතුය". තවද, SS5/2016 හි 12.5 වගන්තියේ සඳහන් වන්නේ, අනුබද්ධිත ආයතනයක (Subsidiary) මණ්ඩලයේ සභාපති, ප්‍රධාන මණ්ඩල උප කමිටුවල සභාපති, ප්‍රධාන විධායක හෝ මූල්‍ය අධ්‍යක්ෂ වැනි සමහර ප්‍රධාන තනතුරු, සමූහ හෝ මව් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක සාමාජිකයින් විසින් දැරීම සාමාන්‍යයෙන් නුසුදුසු බව PRA සලකන බවයි. මණ්ඩලයේ සමස්ත ස්වාධීන සමතුලිතභාවය සතුටුදායක වන තාක් කල්, මව් සමාගමේ විධායක සහ විධායක නොවන මණ්ඩල සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස අනුබද්ධ මණ්ඩලයේ අසුන් ගැනීම මෙයින් වළක්වන්නේ නැත.<br><br>ඒ අනුව, නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීමට යන අවස්ථාවක, මණ්ඩලයේ සමස්ත ස්වාධීන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංයුතිය ද වැඩි කිරීමට එය හේතු වේ.<br><br>BOC කොළඹ විසින් BOC (UK) මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පත් කිරීමට උත්සාහ කර ඇති බව නිරීක්ෂණය විය. 2024 සැප්තැම්බර් 16 වන දින පැවති BOC (UK) මණ්ඩල රැස්වීමේදී, එවකට BOC කොළඹ සභාපති (BOC UK හි දැනුම් දෙන ලද අධ්‍යක්ෂ) විසින් කොළඹින් අතිරේක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු BOC (UK) මණ්ඩලයට එක් කිරීමට යෝජනා කරන ලදී. කෙසේ වෙතත්, මණ්ඩලයේ අසමතුලිතතාවයට එහි බලපෑම සහ BOC (UK) වෙනුවෙන් ක්‍රියා කරන අධ්‍යක්ෂවරුන්ට වඩා ශ්‍රී ලංකාවේ | බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් අවම වශයෙන් INEDs දෙකක් පමණක් තබාගැනීමට බැඳී සිටී. බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත ස්වාධීනත්වයට බාධා නොවන අයුරින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් (NEDs) ලෙස තවදුරටත් අධ්‍යක්ෂවරුන් පත් කිරීම සිදු කෙරේ.<br><br>තවත් අධ්‍යක්ෂවරුන් පත් කිරීම තවමත් අවසන් කර නොමැත. මෙය 2025 පළමු කාර්තුවේදී පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සාකච්ඡා කරුණක් ලෙස ඇතුළත් කෙරේ. | ඵලදායී පාලනයක් පවත්වා ගැනීමට සහ විය හැකි ළබැඳියාවන් අතර ගැටුම් අවම කිරීමට ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සුදුසු සමතුලිතතාවයක් පවත්වා ගනිමින්, අධීක්ෂණ අවශ්‍යතා ප්‍රවේශමෙන් සලකා බලා BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩලයට අනාගතයේදී පත් කිරීම් සිදු කරන බව සහතික කිරීම නිර්දේශ කෙරේ. |

අධ්‍යක්ෂවරුන් විසින් අනවශ්‍ය පීඩනයක් එල්ල කිරීමේ හැකියාව හේතුවෙන් මෙය ක්‍රියාත්මක කිරීමට BOC(UK) අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත නොතිබුණි. කෙසේ වෙතත්, ඡන්ද අයිතිය නොමැතිව ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂවරුන් නිරීක්ෂකයින් ලෙස පත් කිරීමට BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා කර තිබුණි.

## 3.3 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2023 අප්‍රේල් 20 වන දින පැවති රැස්වීමේ වාර්තාවට අනුව, බැංකුවේ එවකට ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් තොරතුරු තාක්ෂණ විශේෂඥයෙකු බඳවා ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළේය. ඔහු ප්‍රකාශ කළේ "බැංකුව මෙම තනතුර සඳහා රැකියා විස්තරයක් නිර්මාණය කර ඇති අතර, එම භූමිකාව භාර ගැනීම සඳහා මව් බැංකුවෙන් සුදුසු අය පමණක් සලකා බලනු ඇති බවයි. නව තොරතුරු තාක්ෂණ තනතුරත් සමඟ, සහකාර අලෙවිකරු තනතුර අනාගතයේදී දිගටම කරගෙන නොයනු ඇත". බැංකුවේ ඩිජිටල් පරිවර්තන සැලසුම් වලදී බැංකුවට සහාය වීම සඳහා තොරතුරු තාක්ෂණ විශේෂඥයෙකු අවශ්‍ය බවත්, පසු කාර්යාලයේ ගෙවීම් සහ පියවීම් පමණක් බලා ගන්නා සහකාර අලෙවිකරුවෙකුට වඩා මෙම තනතුරේ පිරිවැය අර්ධ වශයෙන් ආවරණය කළ හැකි බවත් අධ්‍යක්ෂ මණ්ඩලය ඒකමතිකව එකඟ විය.<br><br>ඒ අනුව, BOC කොළඹ සිට BOC(UK) වෙත ද්විතීයික පදනම මත IT කළමනාකරුවෙකු පත් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 20 වන විගණනය අවසන් වන දිනවන විටත් සහකාර අලෙවිකරු තනතුර අඛණ්ඩව පවතින බව නිරීක්ෂණය විය. | තොරතුරු තාක්ෂණ සම්පත් සඳහා ඇති තීරණාත්මක අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, BOC (UK) සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති විශ්ලේෂකයෙකු බඳවා ගැනීමට ප්‍රමුඛත්වය දීමට තීරණය කරන ලදී. ඒ අනුව, තොරතුරු තාක්ෂණ පද්ධති විශ්ලේෂකවරයකු බඳවා ගන්නා ලදී.<br><br>සහකාර අලෙවිකරු 2023 අප්‍රේල් වන විටත් බැංකුවේ සිටි අතර, ඔහුගේ සේවා කාලය 2025 අප්‍රේල් මාසයේදී අවසන් වීමට නියමිතව තිබුණි. ඉහත තනතුරේ වැදගත්කම අප තේරුම් ගෙන ඇති බැවින්, මෙම තනතුර දිගටම කරගෙන යාමේ අවශ්‍යතාවය තක්සේරු කිරීම සඳහා එක්සත් රාජධානියේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරනු ලැබේ. | තනතුරු අනුපිටපත් වීම වළක්වා ගැනීමට සහ සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම සහතික කිරීම සඳහා බැංකුව එහි කාර්ය මණ්ඩල ව්‍යුහය කඩිනමින් සමාලෝචනය කර අවසන් කිරීම නිර්දේශ කෙරේ. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **බැංකු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම**<br><br>2023 දෙසැම්බර් 18 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවට අනුව, අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇති අතර, ජනවාරි මැද භාගයේදී සිව්වන මහල අවසන් කිරීමටත්, පසුව ඉදිකිරීම්කරුවන් බිම් මහලේ වැඩ සඳහා යාමටත් අපේක්ෂා කරන ලදී. තවද, වසන්ත කාලයේදී කාලගුණය යහපත් වන විට බාහිර වැඩකටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, අප්‍රේල් මාසයේදී එය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.<br><br>ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා, බැංකුව අපේක්ෂිත කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඔවුන්ගේ ලංසු ඇගයීමට ලක් කර තිබුණි. කෙසේ වෙතත්, BOC (UK) සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් නොමැති බව නිරීක්ෂණය විය. | බිම් මහල, තුන්වන සහ සිව්වන මහල මෙන්ම බාහිර කොටසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 2025.02.17 වන දින වන විට අවසන් කර ඇත. බැංකුව දැනට BOC (UK) සඳහා ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරමින් සිටින අතර එය 2025.06.30 වන විට අවසන් කෙරේ. | බැංකුවට, අනාගත මිලදී ගැනීම් සහ කොන්ත්‍රාත් කටයුතු සියල්ල පාලනය කිරීම සඳහාත්, විනිවිදභාවය, සාධාරණත්වය සහ යහපාලන ප්‍රමිතීන්ට අනුකූලවීම සහතික කිරීම සඳහාත්, පරිපූර්ණ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් අනුමතකර සහ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට නිර්දේශ කෙරේ. |

### 3.5 බැන්ක් ඔෆ් සිලෝන් (යූකේ) ලිමිටඩ් හි ප්‍රාග්ධන සීමාව

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | එක්සත් රාජධානියේ ණය දීමේ සහ බිල්පත් වට්ටම් කිරීමේ පරිමාවන්, පවතින නියාමන ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට ආසන්න වී ප්‍රශස්ත මට්ටම් කරා බැංකුව ගමන් කර ඇති අතර, තවදුරටත් ක්‍රියාකාරකම් කිරීම නියාමන සීමාවන් උල්ලංඝනය කිරීමේ අවදානමක් ඇතිකළ හැකිය. වෙළඳ මූල්‍ය අංශයේ, ප්‍රාග්ධන සීමාවන් නිසා වියට්නාමය සහ බංග්ලාදේශය ඇතුළු අලුතින් ඇතුළු වූ වෙළඳපොළවලින් ඉවත් වීමට බැංකුවට බල සිදු වී ඇත. එබැවින්, 2025 ජනවාරි මාසයේදී GBP මිලියන 10.7 ක වර්තමාන | එකඟ වේ.<br><br>BOC (UK) සිය වර්ධන වේගය පවත්වා ගැනීමට සහ තිරසාර පදනමක් මත ලාභ උත්පාදනය කිරීමට නම්, වර්තමාන දිගුකාලීන තැන්පතුව, ස්ථර 1 දිගුකාලීන කොටස් ප්‍රාග්ධනය බවට පරිවර්තනය කළ යුතු බවට අපි එකඟ වෙමු. මෙම පරිවර්තනය, එක්සත් රාජධානියේ වත්මන් ණය පරිමාවන් පුළුල් කිරීමට සහ තිරසාර පරිමාවන් සපයන වෙළඳ මූල්‍ය ව්‍යාපාරය පුළුල් කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රධාන වශයෙන් සපයනු ඇත. දිගුකාලීන තැන්පතුව බැංකුවේ ස්ථර 1 ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීමට මව් බැංකුවට ආරාධනා කරමින් BOC(UK) දැනටමත් ව්‍යාපාර | නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා, දිගුකාලීන ණය, ස්ථර 1 ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම කඩිනම් කිරීම සඳහා BOC (UK) මව් බැංකුව සමඟ අඛණ්ඩව ක්‍රියාකාරීව සම්බන්ධවීම නිර්දේශ කෙරේ. ඒ සමඟම, ණය වර්ධන උපාය මාර්ග සමාලෝචනය කිරීම සහ ප්‍රාග්ධන යෙදවීම ප්‍රශස්ත කිරීම ඇතුළුව නියාමන ප්‍රාග්ධන සීමාවන් කළමනාකරණය කිරීම |

| | | | |
|---|---|---|---|
| | දිගුකාලීන ණය මුදල ස්ථර 1 ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීමෙන් BOC (UK) වෙත සහාය වන ලෙස මව් බැංකුවට ආරාධනා කෙරේ. ඉහත ඉල්ලීම සම්බන්ධයෙන් BOC Colombo හි තීරණය අපේක්ෂාවෙන් සිටියි. | සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කර ඇති අතර මව් බැංකුවේ තීරණය බලාපොරොත්තුවෙන් සිටී. | සඳහා BOC (UK) හදිසි සැලසුම් (Contingency Plans) සකස් කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාලනය සම්බන්ධ නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අධ්‍යක්ෂ මණ්ඩලයේ පත් කිරීම, ඇගයීම, වෘත්තීය සංවර්ධනය සහ ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටියේ 1.2.3 වගන්තිය යටතේ සඳහන් කර ඇති පරිදි, විශේෂයෙන් අධ්‍යක්ෂවරයා වසර නවයකට වඩා වැඩි කාලයක් මණ්ඩලයේ සේවය කර ඇත්නම්, අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන ලෙස සලකා බැලීමට හේතු සඳහන් කිරීමට මණ්ඩලයට හැකි විය යුතුය. කෙසේ වෙතත්, BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩලයේ වසර නවයකට වඩා වැඩි කාලයක් සේවය කර ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනා (INEDs) සඳහා එම ක්‍රියා පටිපාටිය අදාළ කර නොමැති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>දැනට සිටින INEDs වල සේවා කාලය පසුගිය වසර දක්වා මණ්ඩල අනුමැතිය සහිතව වරින් වර දීර්ඝ කර ඇත. බැංකුව දැන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2024.11.30 දින අවසන් වූ Roy England (RE) මහතා සහ 2025.02.28 දින අවසන් වන David Swanney (DS) මහතා වෙනුවට PRA අනුමැතියට යටත්ව INEDs දෙදෙනෙකු 2025.01.17 වන දින පත් කරන ලදී. අලුතින් පත් කරන ලද INEDs සඳහා ගිවිසුම් ලිපි අත්සන් කර ඇති අතර, ඔවුන්ගේ සේවා කාලය පහත පරිදි සඳහන් කර ඇත.<br><br>"විධායක නොවන අධ්‍යක්ෂවරුන් සාමාන්‍යයෙන් වසර දෙකේ සිට තුන දක්වා කාලයක් සේවය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දීර්ඝ කළහොත් මුළු සේවා කාලය උපරිම වශයෙන් වසර පහක් නොඉක්මවන තාක් කල්, මණ්ඩලය ඔවුන්ට අතිරේක කාලයක් සේවය කිරීමට ආරාධනා කළ හැකිය." | අධ්‍යක්ෂ මණ්ඩලයේ අඛණ්ඩ කාර්යක්ෂමතාව සහ පාලන විනිවිදභාවය සහතික කිරීම සඳහා, ලේඛනගත ක්‍රියා පටිපාටි, හොඳම පිළිවෙත් සහ නියාමන මාර්ගෝපදේශ සමඟ සමපාත වන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ වරින් වර සමාලෝචන ක්‍රියාත්මක කිරීම බැංකුව සලකා බැලිය යුතුය. |
| (ii) | 2023 මැයි 04 දිනැති **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** දෙදෙනෙකු විසින් සකස් කරන ලද අනුප්‍රාප්තික සැලසුම් ලේඛනයට අනුව, 2009 දී BOC (UK) සංස්ථාගත කරන විට දැනට සිටින **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** දෙදෙනෙකු පත් කර තිබුණි. ඒ අනුව, | **දැනට සිටින ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් නව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙත සුමටව කාර්යය පැවරීමේ ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින්, DS ගේ සේවා කාලය 2025.12.31 දක්වා දීර්ඝ කර ඇත.** | |

| | | | |
|---|---|---|---|
| | ඔවුන් **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** ලෙස වසර 14 කට ආසන්න කාලයක් සම්පූර්ණ කර ඇත. ඉහත ලේඛනවල, **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** විසින්ම සඳහන් කර ඇත්තේ "***ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුගේ*** *තත්ත්වය බොහෝ ආකාරවලින් වඩාත් සංකීර්ණ වේ. වෙළඳපොළෙන් ආදේශක සොයා ගත හැකි අතර, ඒ සඳහා කාලය ගත විය හැකිය, නමුත් ඉදිරි වසර කිහිපය තුළ පුද්ගලයන් දෙදෙනාම ඉතා දිගු කාලයක් සේවය කරන බැවින් වෙනසක් සිදුවිය යුතුය"*.<br><br>එක් **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකුගේ** ධුර කාලය 2024 ජුනි 30 වන දින සහ තවත් අයකුගේ 2024 දෙසැම්බර් 31 වන දින අවසන් වීමට නියමිත විය. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් දැනට සිටින **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** සඳහා තවදුරටත් කාලය දීර්ඝ කිරීම ලබා දී ඇත. | **සුමට භාරදීමේ ක්‍රියාවලිය සහ අඛණ්ඩතාව මත පදනම්ව මණ්ඩලය මෙම තීරණය ගෙන ඇත.**<br>**කෙසේ වෙතත්, 2025 පෙබරවාරි 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි DS මහතා 2024 නොවැම්බර් 27 වන දින සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කළේය. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා බැංකුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු බඳවා ගෙන ඇත.** | |
| (iii) | 2023 මැයි 04 දිනැති **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** දෙදෙනෙකු විසින් සකස් කරන ලද සහ කොළඹ BOC සභාපති වෙත විද්‍යුත් තැපෑලෙන් යවන ලද අනුප්‍රාප්තික සැලසුම් ලේඛනයට අනුව, ඔවුන් විසින්ම ඔවුන්ගේ සේවා කාලය පහත පරිදි දීර්ඝ කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත.<br><br>i) Roy England මහතා - විශ්‍රාමික බැංකුකරු - 2025 දෙසැම්බර් 31 දක්වා<br><br>ii) David Swanney මහතා - 2027 ජුනි දක්වා වසර තුනක සේවා කාලයක්<br><br>වසර 14 කට ආසන්න කාලයක් **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** ලෙස සේවය කිරීමෙන් පසු, **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** ලෙස ඔවුන් විසින්ම ඔවුන්ගේ නිල කාලය දීර්ඝ කිරීමට එවැනි ඉල්ලීමක් කිරීම නුසුදුසු බව පෙනේ. | අනුප්‍රාප්තික සැලැස්මට අනුව, **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** විසින්ම ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමට මණ්ඩලයට යෝජනා කර ඇති බව නිරීක්ෂණය විය. | |
| (iv) | තවද, එක්සත් රාජධානියේ ආයතනික පාලන සංග්‍රහයේ (එය සම්පූර්ණයෙන්ම හිමිකාරීත්වය දරන අනුබද්ධ සමාගම් සඳහා නිල වශයෙන් අදාළ නොවේ) | මෙය විශාල සමාගම් සඳහා අදාළ වන අතර එය හොඳම භාවිතයක් ලෙස සලකනු ලබයි. දැනට සිටින **ස්වාධීන විධායක නොවන** | පැහැදිලිව සාධාරණීකරණය කළ හැකි, ලේඛනගත සහ මණ්ඩලය විසින් අනුමත |

| | | | |
|---|---|---|---|
| | සඳහන් කර ඇති පරිදි, **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** උපරිම වශයෙන් වසර නවයක් (සාමාන්‍යයෙන් වසර තුනක වාර තුනක්) සේවය කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඉන්පසු ඔවුන් සාමාන්‍යයෙන් තවදුරටත් ස්වාධීන ලෙස නොසැලකේ. තවද, BOC (UK) හි විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනෙකු වන ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී BOC කොළඹ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ලියා ඇත්තේ ලිපිය මඟින් වසර නවයකට වැඩි කාලයක් සේවය කරන අධ්‍යක්ෂවරුන් තවදුරටත් ස්වාධීන ලෙස නොසැලකෙන බවත්, ඔවුන්ගේ ස්වාධීනත්වය අහිමි වීම සම්බන්ධ චෝදනාවලට තමන් විවෘතවීම සහ ආයතනයේ කළමනාකාරිත්වයට ඕනෑවට වඩා සමීප වීම පිළිබඳ බවත් සඳහන් කර තිබුණි. | **අධ්‍යක්ෂවරුගේ** සේවා කාලය පසුගිය වසර දක්වා මණ්ඩල අනුමැතිය ඇතිව වරින් වර දීර්ඝ කර ඇත. PRA අනුමැතියට යටත්ව නව **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** දෙදෙනෙකු පත් කිරීමට බැංකුව දැන් අවශ්‍ය පියවර ගෙන ඇත. | කරන ලද අවශ්‍යතාවයක් සහිතව ඕනෑම ව්‍යතිරේකයක් යටතේ **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුගේ** සේවා කාලය සීමා කරන විධිමත් ප්‍රතිපත්තියක්, බැංකුව ක්‍රියාත්මක කළ යුතුය. |
| (v) | 2023 මැයි 04 දිනැති **ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු** දෙදෙනෙකු විසින් සකස් කරන ලද අනුප්‍රාප්තික සැලසුම් ලේඛනයට අනුව, ප්‍රධාන නියාමන ආයතනය(PRA), බැංකුවේ ශක්‍යතාව තක්සේරු කිරීමේදී ප්‍රධාන කරුණක් ලෙස බැංකු පාලන ක්‍රමයන් කෙරෙහි අවධානය යොමු කරයි. ඔවුන් අතීතයේ දී BOC (UK) සඳහා මෙම ගැටළුව මතු කර ඇත. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් සභාපති තනතුර සම්බන්ධයෙන්, එය සංස්ථාගත කිරීමෙන් පසු සාමාන්‍යයට වඩා වෙනස්කම් මාලාවක් සිදුවී ඇත.<br><br>නව සභාපතිවරයෙකු පත් කරන විට, PRA වෙතින් අනුමැතිය ලබා ගන්නා තෙක්, නව සභාපතිවරයා "දැනුම් දෙන ලද අධ්‍යක්ෂ" ලෙස කටයුතු කළ යුතු අතර, මණ්ඩලයේ තීරණය අනුව ඔහුගේ ඡන්ද අයිතිය (සාමාන්‍ය ඡන්දය සහ ඡන්දය ප්‍රකාශ කිරීමේ ඡන්දය- Casting Vote) ක්‍රියාත්මක කළ නොහැක.<br><br>කාවන් රත්නායක මහතා 2024 මාර්තු 03 වන දින BOC කොළඹ සභාපතිවරයා ලෙස පත් කරන ලද අතර, 2024 සැප්තැම්බර් 25 වන දින දක්වා PRA (ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යය- SMF- | 2024 වසර තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්කම් සහ පවතින තත්ත්වය හේතුවෙන් සභාපති ධුරය නිතර නිතර වෙනස් විය.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විමර්ශන කොන්දේසි (TOR) ප්‍රකාරව, සභාපතිවරයෙකු නොමැති විට, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුට හෝ රැස්වීමේදී පත් කරන ලද සභාපතිවරයෙකුට මණ්ඩල රැස්වීමේ මුලසුන දැරිය හැකි බව දක්වා ඇත. නව සභාපතිවරයෙකු පත් කරන විට PRA අනුමැතිය ලැබෙන තෙක් අන්තර්කාලීන සභාපතිවරයා ලෙස ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනෙකු පත් කිරීම සිරිතකි. PRA වෙතින් සභාපතිවරයා සඳහා අනුමැතිය ලැබෙන තෙක් මෙය කෙටි කාලීන ක්‍රියාමාර්ගයකි. | ඵලදායී පාලනයට සහ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් කළ හැකි, දිගුකාලීනව අන්තර් ක්‍රියාමාර්ග ගැනීම් වළක්වා ගැනීම සඳහා, කාලෝචිත ලෙස සභාපතිවරයා පත් කිරීම සහ PRA අනුමැතිය ලබා ගැනීම සහතික කිරීම සඳහා බැංකුව එහි අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | 9) විසින් ඔහුගේ තනතුර අනුමත කර නොතිබුණි. කෙසේ වෙතත්, ඔහුගේ ඉල්ලා අස්කර ගැනීමේ දැන්වීම (B ආකෘතිය) 2024 සැප්තැම්බර් 25 වන දින PRA වෙත ඉදිරිපත් කර ඇති අතර BOC කොළඹට නව සභාපතිවරයකු පත් කර තිබුණි.<br><br>අනුමත සභාපතිවරයෙකු නොමැති විට, INEDs ගෙන් එක් අයෙකුට BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කිරීමට සිදු විය. මෙය අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තීරණ වලදී මව් බැංකුවේ බලය ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය හැකිය. | | |
| (vi) | ප්‍රධාන විධායක නිලධාරීන් පත් කිරීමේ දිනයන් සහ ඔවුන්ගේ පත්වීම් සඳහා PRA වෙතින් අනුමැතිය ලබා ගැනීමේ දිනයන් අතර සැලකිය යුතු කාල ප්‍රමාදයන් නිරීක්ෂණය විය. විස්තර පහත සාරාංශගත කර ඇත. | එකඟ වේ. | PRA අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන්ට හේතු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සඳහා බැංකුව එහි ප්‍රධාන විධායක නිලධාරී පත්වීම් සහ අනුමත කිරීමේ ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම නිර්දේශ කෙරේ. |

| **ප්‍රධාන විධායක නිලධාරිගේ නම** | **පත්වීම් දිනය** | **PRA අනුමැතිය ක්‍රියාත්මක වන දිනය** | **අනුමැතිය දීමට ගත් කාලය** |
|---|---|---|---|
| අරුණ කුමාර මහතා | 2021 මැයි සිට 2024 මැයි දක්වා<br><br>2024 සැප්තැම්බර් දක්වා කාලය දීර්ග කරන ලදි. | 2021 දෙසැම්බර් 06 | මාස 7 |
| මාධව දිසානායක මහතා | 2024 මාර්තු | 2024 දෙසැම්බර් 06 | මාස 9 |

| | | | |
|---|---|---|---|
| (vii) | අංක 5/2016 දරන අධීක්ෂණ ප්‍රකාශයේ (SS 5/2016) 10 වන වගන්තිය (අනුප්‍රාප්තික සැලසුම්කරණය) අනුව, අධ්‍යක්ෂ මණ්ඩල විසින් එහි සාමාජිකයින්ගේ කුසලතා, පළපුරුද්ද සහ ඵලදායීතාවය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරනු ඇතැයි PRA විසින් අපේක්ෂා කරයි. වත්මන් සහ අනාගත ව්‍යාපාරික අවශ්‍යතා සහ අවශ්‍යතා හඳුනා ගන්නා ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුම් ඔවුන් සතුව | **මෙම නිරීක්ෂණය නිසි ලෙස සටහන් කර ඇත.**<br>BOC (UK) **විසින් ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර ඇති අතර එය** 2025.02.21 **දින පැවති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලදුව ඒහිදී අනුමත කර ඇත. එය** 2025.02.28 **දින** PRA **වෙත** | නායකත්ව හිඩැස් වළක්වා ගැනීම සඳහා, ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් SMF පත්වීම් සඳහා සාමාන්‍ය PRA අනුමත කිරීමේ කාලරාමු බැංකුව විසින් එහි අනුප්‍රාප්තික සැලසුම් රාමුවට කල්තියා ඇතුළත් කිරීම නිර්දේශ |

| | | |
|---|---|---|
| ඇති බව මණ්ඩල සහතික කළ යුතුය. ප්‍රධාන තනතුරු දරන්නන්ගේ අනපේක්ෂිත හැරයාම්, විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හෝ ජ්‍යෙෂ්ඨ රක්ෂණ කළමනාකරුවන්, ක්ෂණික හා කෙටි කාලීන තත්වයන් මෙන්ම දිගු කාලීනව ආවරණය කරන ලද තත්වයන් ඇතුළුව එම කාර්යයන් ආමන්ත්‍රණය කරන අනුප්‍රාප්තික සැලසුම් මණ්ඩල විසින් පවත්වා ගත යුතුය. ඒ අනුව, එහි ක්‍රියා පටිපාටියට අනුව PRA වෙතින් අනුමැතිය ලබා ගැනීමේදී/ලබා දීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් පෙනෙන බැවින්, PRA විසින් ඔවුන්ගේ නිෂ්කාශනය සඳහා ගතවන කාලය සලකා බලා ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීම නිර්දේශ කෙරේ. | **ඉදිරිපත් කරන ලදී.** | කෙරේ.<br>තවද, ඵලදායී පාලනයේ සහ විධායක කළමනාකරණයේ අඛණ්ඩතාව සහතික කරමින්, මතුවන ව්‍යාපාර උපාය මාර්ග සහ නියාමන අපේක්ෂාවන් සමඟ සමපාත වීමට අනුප්‍රාප්තික සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කළ යුතුය. |

**4.2 බැංකුවේ ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | එක්සත් රාජධානියේ බොහෝ ආයතන ඒවායේ පාරිභෝගික හා ආයතන පිරිවැය අඩු කිරීම සඳහා සහ ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා තම ගනුදෙනුකරුවන්ට ඩිජිටල් බැංකුකරණ ක්‍රම ලබා දීමෙන් තාක්ෂණය සමඟ වේගයෙන් ඉදිරියට යමින් සිටියද, BOC (UK) තවමත් එහි ඩිජිටල්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී පසුගාමීව සිටී.<br><br>2023 දෙසැම්බර් 18 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවට අනුව, 2023 වර්ෂය මුලදී මණ්ඩලය විසින් ඩිජිටල් මාර්ග සිතියමක් අනුමත කර ඇති අතර, නොවැම්බර් මාසයේදී ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් සමඟ ගිවිසුමක් අත්සන් කර, 2024 මාර්තු වන විට ප්‍රේෂණ යෙදවුම (Remittance App) සම්පූර්ණ කිරීමට කටයුතු ආරම්භ කර ඇත. මෙම යෙදවුම එක්සත් රාජධානියේ සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවට සහාය වීමට සහ එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට වාර්ෂිකව ප්‍රේෂණය කරන පවුම් මිලියන 10 ක් සඳහා පහසුකම් සැලසීමට මෙම යෙදවුම සහාය දක්වන බවත්, 2023 දී BOC (UK) විසින් එය ළඟා කරගත් බවත්, ප්‍රධාන විධායක නිලධාරීවරයා | නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>බැංකුව එහි ඩිජිටල්කරණ සැලැස්මට අනුව ඉදිරියට යමින් සිටී. ප්‍රේෂණ යෙදවුම 2025.03.31 හෝ ඊට පෙර දියත් කිරීමට නියමිතය. මෙයට සමගාමීව, 2025 ජූනි මස අවසානයට පෙර ගනුදෙනුකරු පහසුකම් සැලසීමේ උත්සවයක් පැවැත්වීමට සැලසුම් කර ඇත. වෙබ් අඩවි ප්‍රතිසංස්කරණය ද සිදුවෙමින් පවතින අතර 2025.05.31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. නියාමන අවශ්‍යතාවලට අනුකූලව ගෙවීම් ලබන්නා තහවුරු කිරීමේ ව්‍යාපෘතිය අවසන් කර ඇත. විශේෂයෙන් IT ආරක්ෂාව සහ ව්‍යාපාර අඛණ්ඩතාව අනුව බැංකුවේ IT යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා තවත් IT ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව නිම කර ඇත. | ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරිභෝගික සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කරමින් BOC (UK) වෙළඳපොලේ තරඟකාරී ලෙස ස්ථානගත කිරීමට නිර්දේශ කෙරේ. |

පැහැදිලි කළේය. කෙසේ වෙතත්, ප්‍රේෂණ යෙදවුම (2024 දෙසැම්බර් අවසානය වන විට දැරූ පිරිවැය ස්ටර්ලින් පවුම් 63,000 කි) 2024 දෙසැම්බර් අවසානය වන විට ක්‍රියාත්මක නොවූ අතර එය බැංකු අවශ්‍යතාවයට ගැලපෙන පරිදි පරීක්ෂණ සහ පාරිභෝගික අවශ්‍යතාවයට ගැලපීම් කිරීමේ අදියරේ පැවතුණි. කෙසේ වෙතත්, මෙම දිනය වන විට සමහර තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති අවසන් කර ඇති බව නිරීක්ෂණය විය.

තවද, ඉහත අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවට අනුව, 2024 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණද, පහත සඳහන් ව්‍යාපෘති/ක්‍රියාකාරකම් 2024 දෙසැම්බර් මාසය අවසන් වන විට සම්පූර්ණ කර නොතිබුණි.

- වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට හා BOC (UK) සඳහා මෙහෙවර ප්‍රකාශයක් ඇතුළත් කිරීමට සහ බැංකුවේ දෘශ්‍යතාව වැඩිදියුණු කිරීමට සැලසුම් කර තිබුණි.
- නව සේවාව පිළිබඳව ගනුදෙනුකරුවන් සමඟ සෘජුවම සන්නිවේදනය කිරීමට, ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත ළඟා වීමට සහ තවදුරටත් අලෙවිකරණ ප්‍රයත්නයන්ට සහාය වීමට බැංකුව පාරිභෝගික පහසුකම් සැලසීමේ උත්සවයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

2024 ජනවාරි මාසයේදී, බැංකුවේ ඩිජිටල් පරිවර්තනයට සහාය වීම සඳහා සහ විවෘත බැංකුකරණය සඳහා නියාමන අවශ්‍යතාවයක් ලෙස, ගෙවීම ලබන්නා තහවුරු කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ද බැංකුව ආරම්භ කරනු ඇත.

## 4.3 බැංකුවේ අනාගත ව්‍යාපාරික විභවයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ගිණුම් විවෘත කිරීමේ පහසුකම් සහ ජංගම බැංකුකරණය ඇතුළු ඩිජිටල් බැංකු සේවා නොමැතිකම බැංකුවේ අභ්‍යන්තර තැන්පතු පදනම පුළුල් කිරීමේ ප්‍රධාන අඩුපාඩු වේ. 2021 වසර අවසානයේදී තැන්පතු එකතු කරන්නෙකු වන “Raising” සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමට බැංකුවට හැකි වූ අතර, එමඟින් අරමුදල් අවශ්‍යතා සඳහා තවදුරටත් කොළඹ ලංකා බැංකුව මත සම්පූර්ණයෙන්ම රඳා සිටීමට සිදු නොවීය.<br><br>බැංකුව ස්වභාවික ප්‍රජාවන් දෙකක් හරහා තම ගනුදෙනුකාර පදනම වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරයි. පළමුවැන්න ශ්‍රී ලාංකික ප්‍රජාව 700,000 ක් පමණ යැයි ඇස්තමේන්තු කර ඇති අතර, දෙවැන්න කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SMEs) ප්‍රජාවයි. ඔවුන් එක්සත් රාජධානිය පුරා ව්‍යාපාර මිලියන 5.9 ක් පමණ වන අතර ඔවුන් විවිධ පසුබිම්වලින් පැමිණි නමුත් විශාලතම ආයතනික සේවාදායකයින් සමඟ වැඩ කිරීමට කැමති විශාල බැංකුවල අවධානයට ලක් නොවී ඇත. ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ ඇති භාෂාමය හා සංස්කෘතික සබඳතා පාරිභෝගික අවශ්‍යතා සන්නිවේදනය සහ අවබෝධය සඳහා බෙහෙවින් පහසුකම් සපයයි.<br><br>සැලකිය යුතු ශ්‍රී ලාංකික ප්‍රජාවන් සිටින සහ ක්‍රියාකාරී හා අන්තර්ක්‍රියාකාරී ප්‍රජාවන්ගේ හොඳින් ස්ථාපිත ජාලයක් ඇති ලන්ඩන්, බර්මින්හැම් සහ මැන්චෙස්ටර් යන භූගෝලීය ප්‍රදේශ තුන කෙරෙහි අවධානය යොමු කිරීමට බැංකුව සැලසුම් කරයි.<br><br>London Forfaiting Agency සහ Credit Europe Bank ඇතුළු ගෝලීය ආයතන සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමෙන්, බංග්ලාදේශය සහ වියට්නාමය වැනි රටවලින් ණයවර ලිපි බිල්පත් මිලදී ගැනීමට බැංකුව උනන්දු කළ හැකි විය. එබැවින්, බැංකුව සාම්ප්‍රදායික ණයවර ලිපි ගනුදෙනුවලින් ඔබ්බට ද්විතීයික | එකඟ වේ.<br><br>අනාගත ව්‍යාපාර විභවය පැහැදිලිව පෙන්නුම් කරන 2025/27 සම්පූර්ණ ව්‍යාපාර සැලැස්ම, 2025.02.21 දින පැවති BOC (UK) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු ව්‍යාපාර සැලැස්ම PRA වෙත යොමු කර ඇත.<br><br>තවද, BOC (UK) සමඟ ඇති මව් බැංකුවේ දිගුකාලීන තැන්පතුව, ස්ථර 1 ප්‍රාග්ධනය (සංවර්ධන සැලැස්ම) බවට පරිවර්තනය කරන ලෙස මව් බැංකුවට ආරාධනා කරන ඉල්ලීමක් 2024 ජූලි මාසයේදී මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර මව් බැංකුවේ තීරණයක් බලාපොරොත්තුවෙන් සිටී. | ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම, තැන්පතු බලමුලු ගැන්වීම සහ තරඟකාරී ස්ථානගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා, මාර්ගගත ගිණුම් විවෘත කිරීම සහ ජංගම බැංකුකරණය ඇතුළු පුළුල් ඩිජිටල් බැංකු සේවා සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව ප්‍රමුඛත්වය දීම නිර්දේශ කෙරේ.<br><br>උපායමාර්ගික මූලපිරීම් ඵලදායී ලෙස ලබා දීම සහතික කිරීම සඳහාත්, තිරසාර වර්ධනයට සහ නියාමන අනුකූලතාවයට සහාය වීම සඳහාත්, අනුමත ව්‍යාපාර සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමීපව නිරීක්ෂණය කළ යුතුය. |

වෙළඳපොළ වෙළඳ මූල්‍යකරණයට ගමන් කරමින් සිටී. කෙසේ වෙතත්, සීමිත ප්‍රාග්ධනයේ සීමාවන් නිසා වෙළඳ මූල්‍යකරණයේ ප්‍රසාරණය සීමා වේ.